[සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
# General Certificate of Education (Ord.Level) Examination, December 2016

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I**
**Business & Accounting Studies I**

**පැය එකයි**
**One hour**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. අවශ්‍යතාවයක් හා වුවමනාවක් නිවැරදිව ගලපා ඇති පිළිතුර වන්නේ,

(1) ඇඳුම් - ඖෂධ (2) ආහාර - රොටි
(3) නිවාස - වෛද්‍ය සායන (4) සන්නිවේදනය - රක්ෂණය

2. ව්‍යාපාරයක කළමනාකරුවන් ව්‍යාපාරය කෙරෙහි උනන්දු වන්නේ,

(1) තම රැකියා සුරක්ෂිතභාවය පිළිබඳව දැනගැනීමට
(2) තමන් ගත් තීරණවල සාර්ථකත්වය දැනගැනීම සඳහා
(3) තම ලාභය ගැන සොයා බැලීමට
(4) පාරිභෝගික සුරක්ෂිතභාවය ගැන සොයා බැලීමට

3. පොළී අනුපාත ව්‍යාපාරයකට බලපාන ආර්ථික පරිසර සාධකයකි. පොළී අනුපාත අඩු කිරීම තුළින් ව්‍යාපාරයකට ඇතිවන බලපෑමක් වන්නේ,

(1) භාණ්ඩවල මිල ඉහළ යාම (2) ණය ලබාගැනීමට පෙළඹීම වැඩිවීම
(3) නිෂ්පාදන අඩුවීම (4) ව්‍යාපාර වියදම වැඩිවීම

4. ව්‍යාපාර සංවිධාන කිහිපයක් පහත දැක්වේ.

A. හවුල් ව්‍යාපාර B. සීමිත සමාගම් C. කේවල ස්වාමි ව්‍යාපාර
D. සමුපකාර E. රාජ්‍ය සමාගම් F. දෙපාර්තමේන්තු
G. රාජ්‍ය සංස්ථා

මේවා අතුරෙන් පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන **පමණක්** ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A , D , E (2) B , D , F (3) C , F , G (4) E , F , G

5. පහත දැක්වෙන්නේ ප්‍රවාහන මාර්ග කිහිපයක් හා ප්‍රවාහන මාධ්‍ය කිහිපයකි,

| ප්‍රවාහන මාර්ගය | මාධ්‍යය |
|---|---|
| i. මහ මාර්ග | A විදුලි දුම්රිය |
| ii. දුම්රිය මාර්ග | B ත්‍රිරෝද රථය |
| iii. ගුවන් මාර්ග | C ගුවන් යානය |

[දෙවන පිටුව බලන්න.

ප්‍රවාහන මාර්ගවලට අදාළ ප්‍රවාහන මාධ්‍යය නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

(1) 1 A, 2 B, 3 C (2) 1 B, 2 A, 3 C
(3) 1 C, 2 B, 3 A (4) 1 B, 2 C, 3 A

6. ශ්‍රී ලංකාවේ වගකීම සීමිත ව්‍යාපාර සංවිධාන අඩංගු පිළිතුර තෝරන්න.
(1) කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සී/ස පොදු සමාගම්
(2) සී/ස පොදු සමාගම්, සී/ස පෞද්ගලික සමාගම්, සමුපකාර
(3) සමුපකාර, හවුල් ව්‍යාපාර, පොදු සමාගම්
(4) සී/ස පෞද්ගලික සමාගම්, හවුල් ව්‍යාපාර, කේවල ස්වාමි ව්‍යාපාර

7. අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ අලෙවි කිරීම හඳුන්වනු ලබන්නේ
(1) සිල්ලර වෙළෙඳාම ලෙස යි. (2) තොග වෙළෙඳාම ලෙස යි.
(3) ඍජු අලෙවිය ලෙස යි. (4) නියෝජිත වෙළෙඳාම ලෙස යි.

8. රක්ෂණ ව්‍යාපාරය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍යයෙන්ම තිබිය යුතු ගුණාංග රක්ෂණ මූලධර්ම ලෙස හැඳින්වේ. පහත සඳහන් ඒවායින් රක්ෂණ මූලධර්මයක් නොවන්නේ කුමක්ද?
(1) රක්ෂණ හිමිකම. (2) හානිපූර්ණය.
(3) ආරක්ෂණය. (4) උපරිම විශ්වාසය

9. හොඳ ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංගයක් වන්නේ,
(1) වේගවත් බව. (2) සුරක්ෂිත බව.
(3) සුලභතාවය. (4) ඉහත සියල්ලම.

10. සැලසුම්කරණය යනු
(1) අතීතය සඳහා වූ ක්‍රියාවලිය කි. (2) වර්තමානය සඳහා වූ ක්‍රියාවලිය කි.
(3) අනාගතය සඳහා වන ක්‍රියාවලිය කි. (4) වර්තමාන ගැටළු විසඳීම සඳහා අදාල වැඩ පිළිවෙල කි.

11. භාණ්ඩ හා සැසඳීමේදී සේවාවක දැකිය හැකි ගති ලක්ෂණයක් වන්නේ
(1) ස්පර්ශ කළ හැකි වීම ය. (2) ඒකාකාරී වීම ය.
(3) වෙන් කළ හැකි හැකි වීම ය. (4) ගබඩා කළ නොහැකි වීම ය.

12. වාණිජ බැංකුවක ජංගම ගිණුම් හිමියකුට සිය ගිණුමෙන් ගෙවීම් කිරීමට යොදාගත හැකි විද්‍යුත් මුදල වන්නේ
(1) ණයපත ය. (2) හරපත ය.
(3) චෙක්පත ය. (4) අණකර ය.

13. පහත දැක්වෙන්නේ රක්ෂණ ආයතනයක් විසින් පළකරනු ලැබූ ප්‍රචාරණ දැන්වීමක කොටසකි.
"හානියක් සිදුවුවත් නොවුවත් ඔබට රක්ෂණ මුදල් ලබාගත හැකි ය. එහෙත් රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකි ය. රක්ෂණ මුදලට අමතරව ප්‍රසාද දීමනා පොළී වැනි ප්‍රතිලාභ සඳහා ද ඔබට හිමිකමක් ඇත."

මෙම දැන්වීම ඉලක්ක කරනු ලබන රක්ෂණ වර්ගය කුමක් ද?
(1) රථ වාහන රක්ෂණය (2) ගිනි රක්ෂණය
(3) මුහුදු උවදුරු රක්ෂණය (4) ජීවිත රක්ෂණය

[තුන්වන පිටුව බලන්න.

14. පහත දැක්වෙන සන්නිවේදන මාධ්‍ය කිහිපයක් හා එම මාධ්‍යවල භාවිත කෙරෙන සන්නිවේදන උපකරණ කිහිපයකි.

| සන්නිවේදන මාධ්‍ය | සන්නිවේදන උපකරණ |
|---|---|
| 1. වාචික | A. කෙටි පණිවුඩ සේවාව (SMS) |
| 2. ලිඛිත | B. දැන්වීම් පුවරුව |
| 3. විද්‍යුත් | C. රැස්වීම් |

සන්නිවේදන මාධ්‍ය වලට අදාළ උපකරණය නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) 1C, 2B, 3A (2) 1B, 2A, 3C
(3) 1C, 2A, 3B (4) 1A, 2C, 3B

15. තොග වෙළෙඳාම හා සිල්ලර වෙළෙඳාම අතර වෙනස තීරණය වන්නේ,

(1) විකුණන භාණ්ඩ ප්‍රමාණය අනුව ය. (2) විකුණුම්කරුගේ පරමාර්ථය අනුව ය.
(3) ගැනුම්කරුගේ පරමාර්ථය අනුව ය. (4) භාණ්ඩයේ මිල අනුව ය.

16. පහත සඳහන් ප්‍රකාශ වලින් ඒකල ස්වාමි ව්‍යාපාරයක් සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

(1) වගකීම සීමාරහිත වීම ය.
(2) වගකීම සීමාසහිත වීම ය.
(3) ප්‍රාග්ධනය අයිතිකරු විසින් යෙදිය යුතු වීම ය.
(4) ලාභාලාභ අයිතිකරු විසින් ලබාගැනීම ය.

17. තොග වෙළෙඳ සැලක් පිහිටුවීමේ දී සැලකිලිමත් නොවිය යුතු කරුණකි.

(1) භාණ්ඩ ගබඩා කිරීමට තිබෙන ඉඩකඩ. (2) ප්‍රවාහන පහසුකම්.
(3) කර්මාන්ත ශාලාවට ආසන්න වීම. (4) පාරිභෝගිකයා ගැවසෙන ස්ථානයක් වීම.

18. ව්‍යාපාරයක බාහිර පරිසරයේ ඇතිවන බලපෑම් දැක්වෙන කාණ්ඩය වනුයේ,

(1) කළමනාකරුවන්, ආර්ථික ප්‍රතිපත්ති, දේශපාලන ප්‍රතිපත්ති.
(2) අයිතිකරුවන්, පවතින නීතිරීති, සංස්කෘතික වෙනස් වීම්.
(3) ආර්ථික ප්‍රතිපත්ති, දේශපාලන ප්‍රතිපත්ති, පවත්නා නීති රීති.
(4) සේවකයන්, කළමනාකරුවන්, ප්‍රජාව.

19. අයිතිකරුවන්, කළමනාකරුවන් හා කළමනාකරුවන් නොවන සේවකයන් අතර නිතර තොරතුරු හුවමාරු කර ගැනීම ව්‍යාපාර ආයතනයක් තුළ නිරන්තරයෙන්ම සිදුවේ. මෙය හැඳින්වෙන්නේ,

(1) අභ්‍යන්තර සන්නිවේදනය යි. (2) බාහිර සන්නිවේදනය යි.
(3) තොරතුරු සන්නිවේදනය යි. (4) වාචික සන්නිවේදනය යි.

20. ඩිජිටල් තාක්ෂණයේ දියුණුවත් සමගම ණයපත් (Credit Card) සහ හරපත් (Debit Card) භාවිතය ඉහළ ගොස් ඇත. මේවා නියෝජනය කරන මුදල් වර්ගය වනුයේ,

(1) බැංකු මුදල් (2) ව්‍යවහාර මුදල්
(3) වලංගු මුදල් (4) විද්‍යුත් මුදල්

21. පහත සඳහන් ගනුදෙනු අතරින් විකුණුම් ජ'නලයේ සටහන් කළ යුතු ගනුදෙනුව වන්නේ,

(1) ස්ථාවර වත්කම් ණයට විකිණීම (2) වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම

(3) ස්ථාවර වත්කම් අත්පිට මුදලට විකිණීම (4) වෙළෙඳ භාණ්ඩ අත්පිට මුදලට විකිණීම

22. මුදල් පොතේ ද්විත්ව කාර්යය වන්නේ,

(1) ලැබීම් හා ගෙවීම් ගිණුමක් ලෙස කටයුතු කිරීම.

(2) ආදායම් හා වියදම් ගිණුමක් ලෙස කටයුතු කිරීම.

(3) මුලික පොතක් හා ලෙජර් ගිණුමක් ලෙස කටයුතු කිරීම.

(4) දුන් වට්ටම් හා ලද වට්ටම් සටහන් කිරීමේ ගිණුමක් ලෙස කටයුතු කිරීම.

23. අත්පිට මුදලට පමණක් ගනුදෙනු කරන මාලිංග ඔහුගේ ව්‍යාපාරික කටයුතු වලදී ගනුදෙනු සටහන් කිරීම සඳහා අදාල කරගන්නා මුලාශ්‍ර ලේඛන වන්නේ,

(1) ගැනුම් ඉන්වොයිසිය හා විකුණුම් ඉන්වොයිසිය

(2) ලදුපත් හා ගැනුම් ඉන්වොයිසිය

(3) ලදුපත් හා වව්චර්

(4) විකුණුම් ඉන්වොයිසි හා වව්චර්

24. ව්‍යාපාරයක මාසික බැංකු ගිණුම් විස්තරය ලැබීමට පෙර මුදල් පොතේ සටහන් කළ නොහැකි ගනුදෙනුවක් වන්නේ,

(1) බැංකු ගාස්තු (2) නිකුත් කළ චෙක්පත්

(3) තැන්පත් කළ චෙක්පත් (4) බැංකුව අගරු කළ චෙක්පත්

25. ව්‍යාපාරයක වගකීම් වලට පමණක් බලපාන ගනුදෙනුව වන්නේ,

(1) රු 3000 ක වට්ටමක් ලැබීම. (2) රු 1000 ක දුරකථන ගාස්තු ගෙවීම.

(3) රු 100,000 බැංකු ණයක් ලබා ගැනීම. (4) රු 50,000 කට රූපවාහිනි යන්ත්‍රයක් මිලදී ගැනීම.

26. වත්කම් පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

(1) බැංකු ණය, යන්ත්‍ර උපකරණ, ගොඩනැගිලි

(2) ගොඩනැගිලි, ලී බඩු, යන්ත්‍ර උපකරණ

(3) ලී බඩු, ණයගැතියෝ, ණයහිමියෝ

(4) ණයහිමියෝ, බැංකු ණය, ගොඩනැගිලි

27. පහත දැක්වෙන්නේ ගිණුම්කරණ සමීකරණයේ අවස්ථාවන් කිහිපයකි. එය වැරදි ලෙස යෙදී ඇති අවස්ථාවක් වන්නේ,

(1) වත්කම් = හිමිකම් + වගකීම් (2) හිමිකම් = වත්කම් – වගකීම්

(3) වගකීම් = වත්කම් + හිමිකම් (4) වගකීම් = හිමිකම් – වත්කම්

28. ආපසු යැවුම් ජ'නලයට අදාල මුලාශ්‍ර ලේඛනය වන්නේ

(1) ලදුපත. (2) බැරපත.

(3) හරපත. (4) ආපසු යැවුම් ඉන්වොයිසිය.

29. ධනුෂ්කාගේ ව්‍යාපාරයේ වසර අවසානයේ පිළියෙල කල ශේෂ පිරික්සුමේ හර සහ බැර එකතුව සමාන වුව ද පහත වැරදි සිදු වී ඇති බව සොයා ගැනුනි. පහත වරදි අතරින් මූලධර්ම දෝෂය වන්නේ,

(1) රු 12000 ක මෝටර් රථ අළුත්වැඩියා වියදම් මෝටර් රථ ගිණුමට හර කිරීම.

(2) ණයගැතියකු වූ සුමින්දගෙන් ලද රු 7000 ක මුදල ගිණුම් වල සටහන් වී නොමැත

(3) ගෙවූ රක්ෂණ ගාස්තු රු 3000 ක් විදුලි ගිණුමට හර කර ඇත.

(4) රු 3000 ක විදුලි බිල ගෙවීම දෙවරක් ගිණුම් වල සටහන් වී තිබීම.

30. ව්‍යාපාරයක ජංගම වගකීම් පමණක් දැක්වෙන කාණ්ඩය කුමක්ද?

(1) ණයහිමියෝ, බොල්ණය, උපචිත විදුලිය

(2) ණයහිමියෝ, උපචිත විදුලිය, බැංකු ණය

(3) ණයහිමියෝ, බැංකු ණය, බොල්ණය

(4) ණයහිමියෝ, උපචිත බැංකු ණය පොලිය, උපචිත විදුලිය.

31. පහත ගනුදෙනු වලින් ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් එකවර වැඩි වන්නේ කවර ගනුදෙනුවකින් ද?

(1) අයිතිකරු ව්‍යාපාරයට ප්‍රාග්ධනය ලෙස මුදල් යෙදවීම.

(2) ව්‍යාපාරයට මෝටර් රථයක් වාසනාගෙන් ණයට ගැනීම.

(3) නැවත විකිණීමේ අරමුණින් කුමාර ස්ටෝර්ස් වෙතින් භාණ්ඩ තොගයක් ගැනීම.

(4) අයිතිකරු විසින් සිය මෝටර් රථය ව්‍යාපාරයට යෙදවීම.

● පහත සඳහන් තොරතුරු උපයෝගිකර ගනිමින් අංක 32 හා 33 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සමන්තගේ ව්‍යාපාරයේ 2015.04.01 දිනට ණයගැතියෝ රු 420000

<u>වර්ෂය තුළ පහත ගනුදෙනු සිදුවිය.</u>

| | |
|---|---|
| ණයට විකුණුම් | රු 500000 |
| අත්පිට විකුණුම් | රු 600000 |
| ණයගැතියන්ගෙන් මුදල් ලැබුනා | රු 480000 |
| ආපසු එවුම් | රු 12000 |
| බොල්ණය | රු 28000 |

32. 2016.03.31 දිනට ණයගැති ශේෂය වන්නේ

(1) රු 1000,000 (2) රු 400,000 (3) රු 420,000 (4) රු 600,000

33. 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ විකුණුම් වන්නේ

(1) රු 1100,000 (2) රු 600,000 (3) රු 1088,000 (4) රු 1178,000

34. ශේෂ පත්‍රයක් පිළියෙල කිරීමේදී ව්‍යාපාරයේ නම සඳහන් කිරීම සමාන්‍ය සිරිතකි. මෙයට අදාල ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) මුල්‍ය මිනුම් සංකල්පය (2) ගැලපුම් සංකල්පය

(3) කාලච්ඡේද සංකල්පය (4) ව්‍යාපාර ඒකක සංකල්පය

Learning Resource Center
R
De Mazenod College
Kandana

35. ව්‍යාපාරියක බැංකු ගිණුමේ බැර පැත්තේ ඉදිරියට ගෙනා ශේෂයක් ඇත්නම් එයින් අදහස් වන්නේ,

(1) ජංගම ගිණුමේ මුදල් ශේෂය
(2) බැංකු ගිණුමේ තැන්පත් කළ මුදල
(3) බැංකුවෙන් ලබාගත් අයිරා ප්‍රමාණය
(4) අදාල ගිණුම් කාලච්ඡේදය තුළ ජංගම ගිණුමෙන් ලබාගත් මුදල

36. මූලික ගිණුම්කරණ සමීකරණය මනාව පිළිබිඹු කරන්නේ,

(1) වෙළෙඳ ගිණුම (2) ලාභාලාභ ගිණුම
(3) ශේෂ පිරික්සුම (4) ශේෂ පත්‍රය

37. ගෙවන ලද රු 35 ක ගෙවල් කුළී වියදම රු 53 ක් ලෙස විදුලි ගිණුමේ පිටපත් කිරීම නිවැරදි කිරීම සඳහා කළ යුතු නිවැරදි සටහන තෝරන්න.

(1) අවිනිශ්චිත ගිණුම හර රු 18, ගෙවල් කුළී ගිණුම බැර රු 18
(2) ගෙවල් කුළී ගිණුම හර රු 18, අවිනිශ්චිත ගිණුම බැර රු 18
(3) අවිනිශ්චිත ගිණුම හර රු 53, ගෙවල් කුළී ගිණුම බැර රු 53
(4) ගෙවල් කුළී ගිණුම හර රු 35, අවිනිශ්චිත ගිණුම බැර රු 35

38. දුන් වට්ටම් තීරුවේ එකතුව වූ රු 50 දුන් වට්ටම් ගිණුමේ බැරට පිටපත් කිරීමේ ප්‍රතිඵලය,

(1) ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු 100 කින් වැඩිවීම යි.
(2) ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු 50 කින් වැඩිවීම යි.
(3) ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු 150 කින් වැඩිවීම යි.
(4) ශේෂ පිරික්සුමේ හර සහ බැර යන දෙපැත්තම වෙනස් නොවීම යි.

- සුමිත්ගේ ව්‍යාපාරයේ කාර්යාලය සඳහා ලී බඩු මිලදී ගැනීමට ගෙවූ රු 12000 ගැනුම් ගිණුමට හර කර ඇත.

39. ඉහත ප්‍රකාශයේ දැක්වෙන ගිණුම්කරණ දෝෂය

(1) ද්විකරණ දෝෂයකි. (2) මූලධර්ම දෝෂයකි.
(3) අත්හැරීම් දෝෂයකි. (4) හිලව් දෝෂයකි.

40. මෙම දෝෂය නිවැරදි කිරීමට අදාළ නිවැරදි ජ'නල් සටහන තෝරන්න.

(1) ලී බඩු ගිණුම හර රු 12000
ගැනුම් ගිණුම බැර රු 12000

(2) ලී බඩු ගිණුම හර රු 12000
මුදල් ගිණුම බැර රු 12000

(3) ලී බඩු ගිණුම හර රු 12000
අවිනිශ්චිත ගිණුම බැර රු 12000

(4) අවිනිශ්චිත ගිණුම හර රු 12000
ගැනුම් ගිණුම බැර රු 12000

******

1 - 04 - 2016

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්

**General Certificate of Education (Ord.Level) Examination, December 2016**

| | |
|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II<br>**Business & Accounting Studies II** | පැය දෙකයි<br>**Two hours** |

Learning Resource Centre
De Mazenod College
Kandana

වැදගත්

පළමුවන ප්‍රශ්නය ඇතුළු ව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. කරුණාරත්න මහතා සිල්ලර වෙළෙන්දෙකි. ඔහුගේ ව්‍යාපාරයේ නම "කරුණා සිල්ලර වෙළෙඳ සැල" ලෙස නම් කරිමට ඔහු තීරණය කරන ලදී. කරුණාරත්න සාධාරන වෙළෙදාමේ නියුතු පුද්ගලයෙකි. ගම් වාසීන්ගේ ආකර්ෂණය ලැබූ මෙම ව්‍යාපාරය දිනෙන් දින ලාභ ලබන ආයතයක් බවට පත් වී ඇත. එම නිසා කරුණාරත්න මහතා තොග වෙළෙදාම සඳහා යොමු වීමටත් තම ව්‍යාපාරයේ ශාඛා දෙකක් අසල ගම් දෙකක ආරම්භ කිරීමටත් අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලබයි.

i. (අ) කරුණාරත්න මහතාගේ ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් ද?
(ආ) එහි ලියාපදිංචිය පිළිබඳව ඔබට කිව හැක්කේ කුමක් ද?

ii. (අ) ව්‍යාපාරයක් යනු කුමක්ද?
(ආ) මිනිස් අවශ්‍යතා සහ වුවමනා අතර පවත්නා වෙනස්කම් **දෙකක්** ලියන්න.

iii. වෙළෙදාමේ ප්‍රභේද ගැලීම් සටහනකින් ඉදිරිපත් කරන්න.

iv. කරුණාරත්න මහතා ඇරඹීමට බලාපොරොත්තු වන තොග වෙළෙදාම සිල්ලර වෙළෙදාමෙන් වෙනස්වන කරුණු **දෙකක්** ලියන්න.

v. ඉහත ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට උපකාරි කර ගන්නා සේවා **දෙකක්** ලියන්න.

vi. (අ) කරුණාරත්න මහතා තම ව්‍යාපාර ගනුදෙනු පහසු කර ගැනීමට බැංකුවේ ආරම්භ කළ යුතු ගිණුම් වර්ගය කුමක්ද?
(ආ) එම ගිණුම් වර්ගය පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයකුට අත්වන වාසි **දෙකක්** ලියන්න.

vii. (අ) බැංකු ජංගම ගිණුමේ මුදල් තැන්පත් කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.
(ආ) චෙක්පතක් ලියා බැංකු ජංගම ගිණුමෙන් මුදල් ආපසු ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

viii. මෙම ව්‍යාපාරය භාවිත කරන්නේ යැයි ඔබ සිතන සන්නිවේදන මාධ්‍ය **දෙකක්** නිදසුන් සහිතව දක්වන්න.

ix. (අ) මෙවැනි ව්‍යාපාරයකට ඇති විය හැකි අවදානම් ආවරණය කර ගැනීම වෙනුවෙන් ලබා ගත යුතු රක්ෂණ ඔප්පු මොනවාද?
(ආ) රක්ෂණයේ වැදගත්කම කරුණු **දෙකකින්** ලියන්න.

x. ඉහත ව්‍යාපාරය සඳහා යෝග්‍ය ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද?

*(ලකුණු 02 X 10 = 20 යි.)*

## I කොටස

### ව්‍යාපාර අධ්‍යයනය

**2.** ව්‍යාපාරවල දියුණුවත් සමගම වේගයෙන් නවීකරණය වූ බැංකු සේවාව තම ව්‍යාපාර කටයුතුවලට අත්‍යවශ්‍යම අංගයක් වී ඇති බව ව්‍යාපාරිකයෝ පවසති.

i. (අ) ව්‍යාපාර සඳහා වඩාත්ම වැදගත්වන සේවා ලබා දෙන බැංකු වර්ගය කුමක්ද?
(ආ) එම බැංකුවෙන් ලබා ගන්නා තැන්පතු ආශ්‍රිත සේවා යටතේ ව්‍යාපාරිකයකුට ආරම්භ කළ හැකි තැන්පතු ගිණුම් වර්ග **දෙකක්** ලියන්න.

ii. (අ) චෙක්පතක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** ලියන්න.
(ආ) චෙක්පත් පිටසන් කිරීම යනු කුමක්ද?

iii. විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා යටතේ ප්‍රචලිත කාඩ්පත් වර්ග දෙකක් දක්වා ඉන් **එකක්** පිළිබඳව හඳුන්වන්න.

iv. (අ) ජංගම ගිණුමක් හා සම්බන්ධ ගාස්තු සහ අය කිරීම් **දෙකක්** ලියන්න.
(ආ) ස්ථාවර නියෝග යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

v. චෙක්පතක් හා සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව **තුන** නම් කර එම පාර්ශ්ව පැහැදිලි කරන්න.

*(ලකුණු 02 X 05= 10 යි.)*

**3.** දිනේෂ් මෝටර්ස් ප්‍රවාහන සේවාවේ ප්‍රමුඛයෝ වී ඇත්තේ හොඳ ප්‍රවාහන සේවාවක් සපයන බැවිනි. එහි සේවකයන්ගේ මනා සංයමය පාරිභෝගිකයන් සිත් ගත්තකි. මෙහි මගී ප්‍රවාහනය සඳහා බස් රථ යොදා ඇති අතර භාණ්ඩ ප්‍රවාහනයට ලොරි, ට්‍රක් රථ, ට්‍රැක්ටර් යොදාගෙන තිබේ. මේ හිමිකරුගේ අරමුණ වන්නේ මනා සේවාවක් ලබා දී ප්‍රමුඛස්ථානයේ රැඳීමටත් පාසැල් සිසුන් සඳහා ප්‍රවාහන සේවයක් ආරම්භ කිරීමටත් ය.

i. ප්‍රවාහනයේ මූලිකාංග **දෙකක්** නිදසුන් සහිතව දක්වන්න.

ii. දුම්රිය මාර්ග ප්‍රවාහනයට සාපේක්ෂව මහා මාර්ග ප්‍රවාහනයේ වාසි **දෙකක්** ලියන්න.

iii. දිනේෂ් මෝටර්ස් ප්‍රවාහන ව්‍යාපාරයේ අවදානම් **දෙකක්** දක්වා එම අවදානම් සඳහා ලබාගත හැකි රක්ෂණ ඔප්පු වර්ග **දෙකක්** ලියන්න.

iv. රක්ෂණයට සම්බන්ධ පාර්ශ්ව **දෙකක්** දක්වා ඒවා හඳුන්වන්න.

v. ජල මාර්ග ප්‍රවාහනයේ සහ ගුවන් මාර්ග ප්‍රවාහනයේ වාසි **දෙක** බැගින් ලියන්න.

*(ලකුණු 02 X 05= 10 යි.)*

**4.** අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සම්පත් සීමිත වීම පොදුවේ සම්පත්වල පවතින ස්වභාවය යි. මෙම ස්වභාවය යටතේ මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකිරීමට ව්‍යාපාර බිහි වී ඇත. එම ව්‍යාපාර සාර්ථක වීමට නම් කළමනාකරණ ක්‍රියාවලිය මනා ලෙස යොදා ගත යුතුය.

i. කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යයන් **දෙකක්** දක්වා ඉන් **එකක්** හඳුන්වන්න.

ii. ව්‍යාපාරයක් කළමනාකරණ කාර්යයන්ට අදාළ ක්‍රියාවලියේදී භාවිතයට ගත හැකි සන්නිවේදන මාධ්‍ය තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු **හතරක්** දක්වන්න.

iii. සන්නිවේදන ක්‍රියාවලිය ගැලීම් සටහනකින් දක්වන්න.

iv. පහත සඳහන් පද කෙටියෙන් පැහැදිලි කරන්න.

- සඵලදායිතාවය
- කාර්යක්ෂමතාවය

v. අලෙවිකරණයට අයත්වන කටයුතු **දෙකක්** ලියන්න.

*(ලකුණු 02 X 05= 10 යි.)*

[අනෙක් පිටුව බලන්න.]

# II කොටස

## ගිණුම්කරණය

5. (අ) 2016.03.01 දින හංසිකා විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් වූ මාසයට අදාළ මුදල් ගනුදෙනු පහතින් දැක්වේ.

| දිනය | ලදුපත් අංකය | වවුචර් අංකය | විස්තරය |
|---|---|---|---|
| 2016.03.01 | 001 | | රු 70,000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කළා |
| 2016.03.02 | | 01 | රු 25,000 ක වෙළෙඳ බඩු මිලදී ගැනීම |
| 2016.03.05 | 002 | | රු 50,000 ක බැංකු ණයක් ගැනීම |
| 2016.03.07 | 003 | | අත්පිට විකුණුම් රු 15,000 කි. |
| 2016.03.09 | | 02 | අත්පිට ගැනුම් රු 8000 කි. |
| 2016.03.12 | | 03 | ප්‍රවාහන ගාස්තු ගෙව්වා රු 500 |
| 2016.03.15 | | 04 | ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ලී බඩු ගත්තා රු 20,000 කි. |
| 2016.03.20 | | 05 | සේවක වැටුප් ගෙව්වා රු 10,000 කි. |
| 2016.03.26 | 004 | | කුළී ආදායම් ලැබුණා රු 7000 කි. |
| 2016.03.30 | 005 | | ලැබූ කොමිස් රු 5000 කි. |
| 2016.03.31 | | 06 | බැංකු ණය කොටසක් ලෙස රු 6000 ක් ගෙව්වා |

අවශ්‍ය වන්නේ

- ඉහත තෙරෙකුරු ඇසුරින් හංසිකාගේ ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කර තුලනය කරන්න.

(ලකුණු 04 යි.)

(ආ) සඳරුවන්ගේ ව්‍යාපාරයේ 2015 ඔක්තෝබර් මාසය සඳහා බැංකු ගිණුම පහතින් දැක්වේ.

බැංකු ගිණුම

| දිනය | විස්තරය | මුදල | දිනය | විස්තරය | මුදල |
|---|---|---|---|---|---|
| 10.01 | මුදල් ශේෂය | 50,000 | 10.05 | චෙක්පත් | |
| 10.03 | මුදල් තැන්පත් | 9,000 | | 168400 (කපිල) | 5,000 |
| 10.07 | චෙක්පත් | | | 168401 (සමන්) | 40,000 |
| | 323510 (ජයසිරි) | 15,000 | 10.10 | චෙක්පත් | |
| 10.26 | චෙක්පත් | | | 168402 (රක්ෂණ) | 5,000 |
| | 236427 (නුවන්) | 30,000 | | 168403 (ගෙවල් කුළී) | 10,000 |
| | 348205 (කමනි) | 50,000 | 10.31 | ශේෂය ප/ගේ | 94,000 |
| | | 154,000 | | | 154,000 |

සඳරුවන්ගේ ව්‍යාපාරයට 2015 ඔක්තෝබර් මාසය සඳහා බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

| දිනය | විස්තරය | ගෙවීම් | ලැබීම් | ශේෂය |
|---|---|---|---|---|
| 10.01 | ශේෂය ඉ/ගේ | | | 50,000 |
| 10.03 | මුදල් තැන්පත් | | 9,000 | 59,000 |
| 10.06 | චෙක්පත් ගෙවීම් 168401 | 40,000 | | 19,000 |
| 10.09 | චෙක්පත් තැන්පතු 323510 | | 15,000 | 34,000 |
| 10.10 | ස්ථාවර නියෝග | 4,000 | | 30,000 |
| 10.11 | චෙක්පත් ගෙවීම් 168402 | 5,000 | | 25,000 |
| 10.16 | ණයගැති ප්‍රේෂණ | | 7,000 | 32,000 |
| 10.25 | ලාභාංශ | | 500 | 32,500 |
| 10.28 | බැංකු ගාස්තු | 1,000 | | 31,500 |

[හතරවන පිටුව බලන්න.

අවශ්‍ය වන්නේ
- බැංකු ගිණුම් ශේෂය සංශෝධනය කිරීම
- බැංකු සැසඳුම් ප්‍රකාශය (ලකුණු 06 යි.)

**6.**

i. ගැනුම් ජ'නලය යනු කුමක්ද? (ලකුණු 02 යි.)

ii. පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි.)

iii. පහත සදහන් තොරතුරු 2016 ජනවාරි මාසය සඳහා තාරකගේ ව්‍යාපාරයට අදාල ගනුදෙනු කිහිපයකි. එම තොරතුරු ඇසුරින් ව්‍යාපාරයේ විකුණුම් ජ'නලය සහ අදාල ගිණුම් පිළියෙල කරන්න. (ලකුණු 06 යි.)

| දිනය | ඉන්වොයිස් අංකය | ගැනුම්කරු | වටිනාකම |
|---|---|---|---|
| 2016.01.03 | 22 | රම්සි ස්ටෝර්ස් | 6,000 |
| 2016.01.08 | 23 | සිතුම් කඩේ | 10,000 |
| 2016.01.12 | 24 | චිත්‍රා හල | 7,000 |
| 2016.01.22 | 25 | ඉන්දිරා ගමන්ට් | 8,000 |
| 2016.01.30 | 26 | ජයරත්න ස්ටෝර්ස් | 4,000 |

**7.**

(i) ගිණුම්කරණයේ වැරදි සිදුවිය හැකි අවස්ථා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි.)

(ii) ශේෂ පිරික්සුම අසමාන වීමට බලනොපාන වැරදි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි.)

(iii) පහත සදහන් වැරදි අප්පුහාමිගේ ව්‍යාපාරයට අදාල ඒවා වේ. එම වැරදි නිවැරදි කිරීම් පොදු ජ'නලයේ සටහන් කරන්න. (ලකුණු 06 යි.)

- ගෙවූ සේවක වැටුප් රු 2000 ක් සටහන් කර ඇත්තේ මුදල් පොතේ පමණි.
- ණයට ගැනුම් රු 5000 ක් සටහන් කර ඇත්තේ ගැනුම් ගිණුමේ පමණි.
- රු 9500 ක විකුණුම් මුදල් පොතේ නිවැරදි ව සටහන් කර විකුණුම් ගිණුමේ සටහන් කර ඇත්තේ රු 5900 ක් ලෙස ය.
- ගෙවූ පොලී ගිණුමේ ශේෂය රු 4000 ක් ශේෂ පිරික්සුමේ සටහන් කර නොමැත.

******